සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

32	S	I

Grade 10 - Second Term Test – 2024(August)
දෙවන වාර පරීක්ෂණය – 2024 (අගෝස්තු) – 10 ශ්‍රේණිය

ගණිතය - I
Mathematics - I

පැය දෙකයි
Two hours

නම /විභාග අංකය...

නිවැරදි බවට සහතික කරමි.

....
නිරීක්ෂකගේ අත්සන

වැදගත් :

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8 කින් සමන්විත ය.
- ❖ **මෙම පිටුවේ ද, තුන්වැනි පිටුවේ ද** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදි ව ලියන්න.
- ❖ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ❖ පිළිතුරු ලිවීමටත් එම පිළිතුර ලබා ගත් ආකාරය දැක්වීමටත් ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- ❖ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** දක්වන්න.
- ❖ පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ :

  A කොටසෙහි එක් එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින්
  B කොටසෙහි එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්
- ❖ කටුවැඩ සඳහා හිස් කඩදාසි භාවිතා කළ හැකි ය.

පරීක්ෂක වරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

කොටස	ප්‍රශ්න අංක	ලකුණු
A	**1 – 25**	
B	**1**	
	2	
	3	
	4	
	5	
එකතුව		
පරීක්ෂකගේ අත්සන		

A - කොටස

ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

($\boldsymbol{\pi}$ හි අගය $\frac{22}{7}$ ලෙස ගන්න.)

1. එක්තරා ඔරලෝසු වර්ගයක් ආනයනයේ දී වටිනාකමින් 10%ක තීරු බද්දක් අයකරයි නම්, රුපියල් 5000ක ආනයනික වටිනාකමක් ඇති ඔරලෝසුවක් සඳහා ගෙවිය යුතු තීරු බදු මුදල කොපමණ ද ?

2. ABD ත්‍රිකෝණයේ BD පාදය E දක්වා දික්කර ඇත. $BD = AD$ නම්, දී ඇති තොරතුරු අනුව x හි අගය සොයන්න.



3. සුළු කරන්න : $\frac{2n}{5m^2} - \frac{3}{2m}$

4. $A \cap B^{/}$ ප්‍රදේශය දී ඇති කුලකයේ අඳුරු කර දක්වන්න.



5. $\frac{x^2(y^{-1})^2}{xy}$ සුළු කර පිළිතුර ධන දර්ශක සහිත ව ප්‍රකාශ කරන්න.

6. සාධක සොයන්න : $x^2 - 9$

7. m^2n, nm, mn^2 මෙම විජීය පදවල කුඩා ම පොදු ගුණාකාරය සොයන්න.

8. $n = m^2 - 2us$ සමීකරණයේ u උක්ත කරන්න.

9. විසඳන්න : $(x-3)(x+2)=0$

10. $60\ kmh^{-1}$ ක වේගයෙන් ගමන් ගන්නා වාහනයකට එක්තරා ගමනක් යාමට පැය 2ක් ගත වේ. එම වාහනය ම $40\ kmh^{-1}$ ක වේගයෙන් ගමන් කළ හොත් එම ගමනට ගතවන කාලය සොයන්න.

11. ABC හා PQR ත්‍රිකෝණවල $A\hat{B}C = P\hat{Q}R = 90°$ සහ $BC = QR$ වන ත්‍රිකෝණ යුගලයක් ඇඳ එම ත්‍රිකෝණ යුගලය **කර්ණ,පා** අවස්ථාවෙන් අංගසම වීමට සමාන විය යුතු අනෙක් අංගය ලියන්න.

12. රූපයේ දැක්වෙන්නේ වර්ගඵලය $462\ cm^2$ ක් වූ කේන්ද්‍රික ඛණ්ඩයක් නම්, එහි අරය සොයන්න



13. මල්ලක රතු පබළු තුනක් හා නිල් පබළු පහක් ඇත. සසම්භාවී ලෙස මල්ලෙන් පබළුවක් ඉවතට ගනු ලැබේ නම්, රතු පබළුවක් ලැබීමේ සම්භාවිතාව කොපමණ ද?

14. රූපයේ දැක්වෙනුයේ O කේන්ද්‍රය වූ වෘත්තයකි. දී ඇති තොරතුරු ඇසුරෙන් $A\hat{B}O$ හි අගය සොයන්න.



15. $y = 3x - 2$ සරල රේඛාවේ, අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය ලියන්න.

16. මිනිසකුගේ දැන් වයස ඔහුගේ පුතාගේ වයස මෙන් හතර ගුණයක් වන අතර අවුරුදු හයකට පෙර ඔහුගේ වයස පුතාගේ වයස මෙන් හය ගුණයකි. මිනිසා ගේ දැන් වයස සොයන්න.

17. රූපයේ දී ඇති දත්තවලට අනුව x හි අගය සොයන්න.



18. $\sqrt{245}$ පළමු සන්නිකර්ෂණය සොයන්න.

19. $4x - 5y = -7, 4y - 3x = 12$ නම්, මෙම සමගාමී සමීකරණ යුගල විසඳීමෙන් තොර ව $(x - y)$ හි අගය ලබා ගන්න.

20. O කේන්ද්‍රය වූ වෘත්තයේ AB යනු විෂ්කම්භයක් වේ නම්,

(i) $A\hat{C}B$ = ...

(ii) $A\hat{B}C$ = ...අගය සොයන්න



21. BC චාපයේ දිග $22\ cm$ක් වේ නම්, සංයුක්ත රූපයේ පරිමිතිය සොයන්න.



22. $ABCD$ සමාන්තරාස්‍රයේ වර්ගඵලය $82\ cm^2$ නම්, ABC ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න



23. $3x \leq 15$, මෙම අසමානතාවය විසඳා විසඳුම් සංඛ්‍යා රේඛාවක නිරූපණය කරන්න.

24. යම් කාර්යයක් නිම කිරීමට මිනිසුන් 8 දෙනෙකුට දින 9ක් ගත වෙයි. තවත් මිනිසුන් හතරදෙනෙකු එම කාර්යය සඳහා යොදවන්නේ නම්, එම කාර්යය නිම කිරීමට ගතවන දින ගණන සොයන්න.

25. AB හා BC වීදි මායිම් දෙකක් රූපයේ දැක් වේ. AB හා BC මායිම් දෙකට සම දුරින් ද B මංසන්ධියට $5\ cm$ දුරින් ද සිටින සේ පහන් කණුවක් සිටුවිය යුතු නම්, පථ පිළිබඳ දැනුම භාවිතයෙන් පහන් කණුව සිටු විය යුතු ස්ථානයේ දළ සටහනක් අඳින්න.



50

B කොටස

ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

1. ගුණසේකර පොත් සාප්පුවේ ඇති පොත්වලින් $\frac{1}{3}$ ක් පාසල් විෂය නිර්දේශයට අයත් විෂයානුබද්ධ පොත්වන අතර ඉතිරියෙන් $\frac{2}{3}$ ක් නවකතා පොත් වේ. ඉතිරි පොත් ප්‍රමාණය කෙටිකතා හා පරිවර්තන වන අතර ඒවා සමාන ප්‍රමාණවලින් පවතී. පරිවර්තන කතා පොත් 720 පවතින අතර එම පරිවර්තන කතා පොත් අසුරා ඇති වානේ රාක්කවල මුළු වටිනාකම රුපියල් $15\ 000$ක් බව ගුණසේකර මහතා ප්‍රකාශ කරයි.

(i) පොත් සාප්පුවේ ඇති විෂයානුබද්ධ නොවන පොත් ප්‍රමාණය, මුළු පොත් ප්‍රමාණයෙන් කවර භාගයක් ද ?

(ii) නවකතා පොත් ප්‍රමාණය සාප්පුවේ ඇති මුළු පොත් ප්‍රමාණයෙන් කවර භාගයක් ද ?

(iii) පරිවර්තන කථා පොත් ප්‍රමාණය සාප්පුවේ ඇති මුළු පොත් ප්‍රමාණයෙන් කවර භාගයක් ද ?

(iv) ගුණසේකර පොත් සාප්පුවේ ඇති මුළු පොත් ප්‍රමාණය කොපමණ ද ?

10

(v) සෑම පොතක් ම ඇසිරීම සඳහා යන ඉඩ ප්‍රමාණය සමාන යැයි උපකල්පනය කරමින්, ගුණසේකර පොත් සාප්පුවේ පොත් සියල්ල ම අසුරා ඇති වානේ රාක්කවල වටිනාකම කොපමණදැයි ගණනය කරන්න.

2. රූපයේ දැක්වෙනුයේ $ABCD$ සෘජුකෝණාස්‍රාකාර තහඩු කැබැල්ලක් හා EF අරය වූ කේන්ද්‍රික ඛණ්ඩාකාර තහඩු කොටසක් එකිනෙක පාස්සා සකස් කරගත් තහඩුවකි.



(i) කේන්ද්‍රික ඛණ්ඩ කොටසේ අරය කීයද?

(ii) මෙම තහඩුවේ පරිමිතිය සොයන්න.

(iii) මෙම තහඩුවේ වර්ගඵල සොයන්න.

10

(iv) මේ සඳහා යොදාගත් තහඩුවේ $1\ cm^2$ ක ස්කන්ධය $20.5g$ක් නම් සකසාගත් මෙම තහඩුවේ මුළු ස්කන්ධය සොයන්න.

3. එක්තරා වැඩක් නිම කිරීම සඳහා යෙද වූ මිනිසුන් 12 දෙනෙකුට දින හයක දී නිම කිරීමට හැකි වූයේ මුළු වැඩ ප්‍රමාණයෙන් $\frac{3}{5}$ ක ප්‍රමාණයක් පමණි.

(i) නිම කළ වැඩ ප්‍රමාණය මිනිස් දින කොපමණ ද?

(ii) නිම කිරීම ට ඇති වැඩ ප්‍රමාණය භාගයක් සේ දක්වා එම වැඩ ප්‍රමාණය කොපමණදැයි ගණනය කරන්න.

(iii) සම්පූර්ණ වැඩය නිම කිරීමට ගතවන මිනිස් දින ගණන කොපමණ ද?

(iv) මුල සිට ම තවත් මිනිසුන් 12 දෙනෙකු යොදා ගනිමින් එම වැඩය සම්පූර්ණයෙන් ම නිම කිරීමට කොපමණ දින ගණනක් ගතවේ ද?

10

(v) එක් මිනිසකුට එක් දිනකට රුපියල් 5000 බැගින් ගෙවන්නේ නම්, එම වැඩය නිම කිරීමට ගිය මුළු මුදල ගණනය කරන්න.

4. එක්තරා දිනක රාජකීය මාවතේ ගමන් කළ රථ වාහන 40ක් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

වාහන වර්ගය	ප්‍රමාණය	කේන්ද්‍ර කෝණ
බස්	10	....
කාර්	……………..	....
වෑන්	8	....
මෝටර් සයිකල්	2	....

(i) කාර් රථ ප්‍රමාණය කොපමණ ද?

(ii) ඉහත වගුවේ හිස්තැන් සියල්ල සම්පූර්ණ කරන්න.

(iii) ඉහත දී ඇති තොරතුරු වට ප්‍රස්තාරයක දක්වන්න.

(iv) එම රථ වාහනවලින් 20% ක් පාර අයිනේ නවතා තැබීම නිසා රථ වාහන පොලීසිය විසින් දඩ නියම කරන ලදි. එක් දඩ කොලයක් සඳහා රුපියල් 1500ක් නියම වුයේ නම්, රථවාහන පොලීසිය එදින ලැබූ මුළු දඩ මුදල් ආදායම කොපමණ ද?

10

5. (a) මල්ලක එකම තරමේ හා එකම හැඩයේ අඹ රසැති ටොෆි 5ක් ද දිවුල් රසැති ටොෆි 3ක් ද ඇත. වාරුක අහඹු ලෙස ටොෆියක් ඉවතට ගනී.

(i) ඉහත පරීක්ෂණයේ නියැදි අවකාශය (S) ලියා දක්වන්න.

(ii) ඉවතට ගත් ටොෆිය අඹ රසැති ටොෆියක් වීමේ සම්භාවිතාවය කොපමණ ද?

(iii) ඉවතට ගත් ටොෆිය අඹ රසැති ටොෆියක් නොවීමේ සම්භාවිතාවය කොපමණ ද?

(b) පහත සඳහන් කුලක සලකන්න.

A $= \{$ "$CHARACTERISITICS$ " යන වචනයේ අකුරු $\}$
B $= \{$ " $EXPERIMENTS$ " යන වචනයේ අකුරු $\}$

(i) A හා B කුලක අවයව සහිතව ලියා දක්වන්න.

(ii) $n(A)$ හා $n(B)$ සොයන්න.

(iii) $A \cup B$ හා $A \cap B$ කුලක අවයව සහිතව ලියා දක්වන්න.

(iv) ඉහත A හා B කුලක දී ඇති වෙන් රූපයේ දක්වන්න.

10



***

සියලු ම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

Royal College – Colombo 07

රාජකීය විද්‍යාලය – කොළඹ 07

32 | S | II

Grade 10- Second Term Test –2024(August)

දෙවන වාර පරීක්ෂණය – 2024 (අගෝස්තු) – 10 ශ්‍රේණිය

ගණිතය - II

Mathematics-II

පැය තුනයි
Three hours

උපදෙස්:

- **A කොටසෙන්** ප්‍රශ්න **පහක්** හා **B කොටසෙන්** ප්‍රශ්න **පහක්** තෝරා ගෙන ප්‍රශ්න **දහයකට** පිළිතුරු සපයන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** ලියා දක්වන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

A - කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. **(a)** රු. 250 000ක් ලෙස තක්සේරු කර ඇති නිවසක් සඳහා 6% ක වාර්ෂික වරිපනම් බද්දක් පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු වේ.

(i) වාර්ෂිකව ගෙවිය යුතු වරිපනම් බදු මුදල සොයන්න.

(ii) කාර්තුවකට ගෙවිය යුතු මුදල සොයන්න.

(iii) නිවසේ තක්සේරු වටිනාකම 20% කින් වැඩි කිරීමට එම පළාත් පාලන ආයතනය තීරණය කරන ලද්දේ නම්, කාර්තුවකට වැඩිපුර ගෙවීමට සිදුවන මුදල සොයන්න.

(b) එක්තරා පුද්ගලයෙක් භාණ්ඩයක් ආනයනය කිරීමේ දී එහි ආනයනික වටිනාකමෙන් 35% ක තීරු බද්දක් ගෙවයි. තීරු බදු ගෙවූ පසු එම භාණ්ඩයේ වටිනාකම රු. 81 000 ක් වේ නම්, එම භාණ්ඩයේ ආනයනික මිල සොයන්න.

2. $y = x^2 - 6$ යන ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා සකස් කරන ලද අසම්පූර්ණ අගය වගුවක් පහත දැක් වේ.

x	-3	-2	-1	0	1	2	3
y	3	-2	___	-6	-5	-2	3

(i) $x = -1$ වන විට y හි අගය සොයන්න.

(ii) සුදුසු පරිමාණයක් භාවිතා කරමින් ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය, ප්‍රස්තාර කඩදාසියක අඳින්න.

(iii) අඳින ලද ප්‍රස්තාරය භාවිතයෙන් $x^2 - 6 = 0$ සමීකරණයේ මූල සොයන්න.

(iv) ශ්‍රිතය සෘණව වැඩිවන xහි අගය පරාසය ලියා දක්වන්න.

(v) ඉහත ප්‍රස්තාර හැඩය නොවෙනස් ව පවත්වා ගනිමින්, y අක්ෂය ඔස්සේ ඒකක 3ක් සිරස්ව ඉහළට විස්ථාපනය කළ විට ලැබෙන නව ප්‍රස්තාරයේ ශ්‍රිතය ලියා දක්වන්න.

3. පහතින් දැක්වෙන්නේ පැත්තක දිග $(2x - 1)\ m$ ක් වූ සමචතුරස්‍රාකාර ඉඩමකි. එහි දිග හා පළල පිළිවෙළින් $(x + 1)\ m$ හා $(x - 1)\ m$ වන පරිදි සෘජුකෝණාස්‍රාකාර පිහිනුම් තටාකයක් ඉදිකර ඇත.

(i) පිහිනුම් තටාකය ඉදිකළ පසු ඉතිරි ඉඩමේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(ii) ඉතිරි කොටසේ වර්ගඵලය $9\ m^2$ක් නම්, එමගින් $3x^2 - 4x - 7 = 0$ සමීකරණය තෘප්ත කරන බව පෙන්වන්න.

(iii) ඉහත සමීකරණය විසඳීමෙන් xහි අගය ආසන්න පූර්ණ සංඛ්‍යාවට සොයා, එමගින් පිහිනුම් තටාකයේ මුළු වර්ගඵලය සොයන්න.



4. **(a)** පාසලක ඩෙංගු මර්ධන වැඩසටහනක් සඳහා සේවකයින් 15 දෙනෙකු සහභාගී කරගන්නා ලදි. ඔවුන් අතරින් පිරිමි සේවකයින් ගණන කාන්තා සේවිකාවන් ගණන මෙන් තුන්ගුණයකට වඩා 1 ක් අඩුය. පිරිමි සේවකයින් ගණන x ලෙසද, කාන්තා සේවිකාවන් ගණන y ලෙස ද ගෙන සමගාමී සමීකරණ යුගලයක් ගොඩනගා එය විසඳීමෙන්, පැමිණ සිටි පිරිමි සේවකයින් ගණන හා කාන්තා සේවිකාවන් ගණන වෙන වෙන ම සොයන්න.

(b) සුළු කරන්න: $\frac{x-2}{2x-1} - \frac{3x-1}{2x-1}$

5. බටහිර සිට නැගෙනහිර දෙසට වැටී ඇති සෘජු මාර්ගයක A නම් ලක්ෂ්‍යයක සිටින පුද්ගලයෙක් $135°$ ක දිගංශයකින් C ලක්ෂ්‍යයේ පිහිටි පොල් ගසක් නිරීක්ෂණය කරයි. A සිට මාර්ගය ඔස්සේ මීටර 180 ක් නැගෙනහිර දිශාවට පැමිණ B ලක්ෂ්‍යයේ සිට පොල්ගස නිරීක්ෂණය කළ විට එහි දිගංශය $220°$ කි.

(i) ඉහත තොරතුරු දළ සටහනක දක්වන්න.

(ii) සුදුසු පරිමාණයක් භාවිතයෙන් පරිමාණ රූපයක් ඇඳ, එමගින් A සිට පොල් ගසට ඇති දුර සොයන්න.

6. පහත දැක්වෙන්නේ එක්තරා නගරයක පිහිටි වෙළෙඳ සැලක 35ක් දිනක දී, විදුලි පරිභෝජනය පිළිබඳ විස්තරයකි.

විදුලි ඒකක ගණන	10	12	14	16	18	20
නිවාස ගණන	3	4	6	9	8	5

(i) මෙම දත්තවල මාතය සොයන්න.

(ii) වෙළෙඳ සැලක් දිනක දී පරිභෝජනය කළ මධ්‍යන්‍ය විදුලි ඒකක ගණන ආසන්න පූර්ණ සංඛ්‍යාවට සොයන්න.

(iii) විදුලි ඒකකයක මිල රුපියල් 40ක් නම්, ඉහත මධ්‍යන්‍ය විදුලි ඒකක ගණන භාවිතයෙන් මෙම නගරයේ පිහිටි වෙළෙඳ සැලක මාසික විදුලි බිල ගණනය කරන්න.

B - කොටස

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

7. සැරසිල්ලක් සඳහා බටයක් කැබලිවලට කපා ඇත්තේ ඒවා උස අනුපිළිවෙළට සැකසූ විට දිගින් වැඩි ම බට කැබැල්ල $60\ cm$ ක් ද ඊට පසුව ඇති සෑම බට කැබැල්ලක් ම ඊට පෙර බට කැබැල්ලේ දිගට වඩා $8\ cm$ ක් අඩුවන ලෙසය.

(i) කපන ලද පළමු බට කැබලි තුනේ දිග අනුපිළිවෙළින් ලියන්න.

(ii) එක් එක් බට කැබැල්ලේ දිග දැක්වෙන සංඛ්‍යා රටාවේ පොදු පදය, T_n සඳහා ප්‍රකාශනයක් n ඇසුරෙන් ලියා දක්වන්න.

(iii) පොදු පදය ඇසුරෙන් 6 වන බට කැබැල්ලේ දිග සොයන්න.

(iv) මෙහි කිසියම් බට කැබැල්ලක දිග $16\ cm$ බව සුමිත් පවසයි. ඔහුගේ මෙම ප්‍රකාශය සත්‍යය ද? හේතු දක්වන්න.

(v) ඉහත ආකාරයට කැපිය හැකි උපරිම බට කැබලි සංඛ්‍යාව සොයන්න.

8. පහත දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණ සඳහා cm/mm පරිමාණය සහිත සරල දාරයක් සහ කවකටුවක් පමණක් භාවිතා කරන්න. නිර්මාණ රේඛා පැහැදිලි ව දක්වන්න.

(i) $AB = 8.5\ cm,\ A\hat{B}C = 60°,\ BC = 7\ cm$ වන පරිදි වූ ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) $A\hat{B}C$ හි කෝණ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

(iii) C ලක්ෂ්‍යයේ සිට ABට ලම්බ රේඛාවක් නිර්මාණය කර, එය AB හමුවන ලක්ෂ්‍යය D ලෙස නම් කරන්න.

(iv) $A\hat{B}C$ කෝණ සමච්ඡේදකය සහ CD රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය O ලෙස නම් කර, OB අරය ලෙස ගෙන O කේන්ද්‍රය වූ වෘත්තයක් නිර්මාණය කරන්න.

(v) $O\hat{C}B = O\hat{B}C$ වීමට හේතු දක්වන්න.

9. (a) සමද්විපාද ත්‍රිකෝණ සම්බන්ධ ප්‍රමේයය ලියා දක්වන්න.

(b) රූපයේ දැක්වෙන ABC ත්‍රිකෝණයේ D සහ E ලක්ෂ්‍යය BC මත පිහිටා ඇත්තේ, $BD = EC$ වන පරිදි ය. තව ද $AD = AE$ ද වේ.



(i) රූපය පිටපත් කර දත්ත එහි ඇතුළත් කරන්න.

(ii) ABD ත්‍රිකෝණය සහ AEC ත්‍රිකෝණය අංගසම බව පෙන්වන්න.

(iii) ABC සමද්විපාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න.

(iv) $B\hat{A}E = C\hat{A}D$ බව පෙන්වන්න.

10. සනකාභ හැඩැති ගෘහස්ථ වතුර ටැංකියේ දිග, පළල සහ උස පිළිවෙලින් $200\ cm$, $150\ cm$ සහ $150\ cm$ වේ.

(i) ටැංකියේ ධාරිතාව m^3 කීය ද?

(ii) ටැංකියේ ධාරිතාව ලීටර්වලින් ප්‍රකාශ කරන්න.

(iii) මිනිත්තුවට $150\ l$ ජල සැපයුමක් භාවිතා කළහොත් ටැංකිය සම්පූර්ණයෙන් ජලයෙන් පිරවීමට කොපමණ කාලයක් ගතවේ ද?

(iv) නිවැසියන් 5 දෙනෙකු සිටින නිවසක එක් පුද්ගලයෙකු දිනකට භාවිතා කරන ජල පරිමාව $180\ l$ බව නිමානය කර ඇත. ටැංකිය සම්පූර්ණයෙන් ජලයෙන් පිරී ඇති අවස්ථාවක නැවත ටැංකියට ජලය පිරවීමකින් තොරව දින 3ක් භාවිතා කළේ නම්,

(a) ටැංකියේ ඉතිරිවන ජල පරිමාව ලීටර්වලින් සොයන්න.

(b) එවිට ටැංකියේ ජල මට්ටමේ උස සෙන්ටිමීටර්වලින් සොයන්න.

11. මිශ්‍ර පාසලක 10 වන ශ්‍රේණියේ සිසුන් 125ක් ඉගෙනුම ලබන අතර ඉන් 70ක් ගැහැණු ළමයි වේ. ගැහැණු ළමයි 10 දෙනෙක් මළල ක්‍රීඩාවල නිරත වන අතර මළල ක්‍රීඩාවල නිරත නොවන පිරිමි ළමයි ගණන 40කි.

(i) ඉහත තොරතුරු වෙන් රූප සටහනක දක්වන්න.

(ii) මළල ක්‍රීඩාවල නිරත නොවන ගැහැණු ළමයි ගණන කීය ද?

(iii) මළල ක්‍රීඩාවල නිරත වන පිරිමි ළමයි ගණන දක්වන ප්‍රදේශය ඉහත වෙන් රූපයේ අඳුරු කරන්න.

(iv) මළල ක්‍රීඩාවල නිරත වන මුළු ළමයි ගණන කීය ද?

12. (a) චතුරස්‍රයක් සමාන්තරාස්‍රයක් වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

(b) රූපයේ දැක්වෙන $ABCD$ සමාන්තරාස්‍රයේ BD විකර්ණය මත $DP = BQ$ වන පරිදි P සහ Q ලක්ෂ්‍ය පිහිටා ඇත.

(i) පහත රූපය ඔබේ උත්තර පත්‍රයේ පිටපත් කර දී ඇති තොරතුරු එහි ඇතුළත් කරන්න.

(ii) $AP = QC$ බව පෙන්වන්න.

(iii) $AP\ //\ QC$ බව පෙන්වන්න.

(iv) APQ ත්‍රිකෝණයේ වර්ගඵලය $=$ PQC ත්‍රිකෝණයේ වර්ගඵලය බව පෙන්වන්න.



***

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න